# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,885/1 — 1969 දෙසැම්බර් 31 වැනි බදාදා — 1969.12.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 124/42

### ලංකා තැපැල් කාර්‍යාල ඉතිරි කිරීමේ බැංකු ආඥාපනත

**දැන්වීම**

(191 වැනි අධිකාරය වන) ලංකා තැපැල් කාර්‍යාල ඉතිරි කිරීමේ බැංකු ආඥාපනතේ 7 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමති, වෝල්ටර් ජෝෆ්රි මොන්ටේගු ජයවික්‍රම වන මම, මුදල් ඇමති වරයාගේ එකඟත්වය ඇතිව, තැපැල් කාර්‍යාල ඉතිරි කිරීමේ බැංකුවට තැන්පතු වශයෙන් ගෙවන ලද මුදල්වලට ගෙවිය යුතු පොලිය 1970 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, වර්ෂයකට රුපියල් සියයට රුපියල් තුනයි ශත හැටේ ප්‍රමාණයට වන ලෙස මෙයින් නියම කරමි.

මොන්ටේගු ජයවික්‍රම,
රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමති.

1969 දෙසැම්බර් මස 28 වන දින,
කොළඹ දී ය.

12—1506

---

ඇල්.ඩී.—බී. 80/44

### පඩිපාලක සභා ආඥාපනත

**නිවේදනය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරනු ලැබ, මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණයන් කම්කරු හා රැකීරක්ෂා ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව ඒ ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**මේ තීරණ 1969 දෙසැම්බර් මස 31 වන දින සිට වලංගු විය යුතුය.**

**ජී. පී. තම්බයියා,**
**කම්කරු හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.**

**1969 දෙසැම්බර් මස 30 වන දින,**
**කොළඹ දී ය.**

### උපලේඛනය

මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරන ලදුව වර්ෂ 1947 පෙබරවාරි මස 14 වන දින අංක 9,667 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූද, කලින් කල වෙනස් කරනු ලැබූද තීරණ එම උපලේඛනයෙහි IV වන කොටසෙහි '' ආණ්ඩුවේ නිවාඩු දවස් '' යන ශීර්ෂය යටතේ දැක්වෙන 1, 2 සහ 3 වන ඡේද ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය :—

'' ආණ්ඩුවේ නිවාඩු දවස්

1. (අ) (i) මේ ඡේදයේ සහ 2 සහ 3 යන ඡේදවල විධිවිධාන වලට යටත්ව සෑම සේවායෝජකයකුම තමා යටතේ සේවයෙහි යොදවා සිටින්නාවූ සියලුම කම්කරුවන්ට 1965 අංක 17 දරණ නිවාඩු පනත යටතේ පහත සඳහන් ආණ්ඩුවේ නිවාඩු දවස් පඩි සහිත නිවාඩු දින වශයෙන් දිය යුතුය :—

(1) ජාතික වීරවරයින්ගේ දිනය ;

(2) දෙමළ තෛපොන්ගල් දිනය ;

(3) නිදහස් අනුස්මරණ දිනය (පෙබරවාරි 4) ;

(4) සිංහල සහ දෙමළ අළුත් අවුරුදු දිනට පෙරාතුව වූ දිනය ;

(5) සිංහල සහ දෙමළ අළුත් අවුරුදු දිනය ;

(6) මැයි දිනය (මැයි 1) ;

(7) සිංහල මාස ක්‍රමයෙන් වෙසක් මස පුර පසළොස්වක් පොහෝ දිනය ;

(3) මීලාඩ්-උන්-නබි (මොහමඩ් නබිනායක තුමාණන්වහන්සේගේ උපන් දිනය) ;

(9) නත්තල් දිනය.

(ii) මෙම ඡේදයෙහි (1) වන අනුච්ඡේදයෙහි සඳහන්ව ඇත්තාවූ යම් ආණ්ඩුවේ නිවාඩු දවසක් කම්කරුවකු වැඩ වර්ජනයක යෙදී සිටින කාල සීමාවකට යෙදුණු කවර අවස්ථාවකදීවත්, ඒ කම්කරුවාට ඒ අනුච්ඡේදයේ විධිවිධාන අදාල නොවිය යුතුය.

(ආ) (අ) (1) වැනි අනුච්ඡේදයේ සඳහන් එක් එක් ආණ්ඩුවේ නිවාඩු දිනය වෙනුවෙන් ගෙවිය යුතු පඩිය—

(i) ස්ථිර කම්කරුවකු සම්බන්ධයෙන් වූ කල්හි, ඒ නිවාඩු දිනය දුන් මාසයේ වේතනයට ඇතුළත් කළ යුතු අතර එකී මාසයේ වේතනය ගණන් බැලීම සඳහා ඒ දිනය වැඩ කරන සාමාන්‍ය දිනයක් වශයෙන් සැලකිය යුතුය ; තවද

(ii) දවස් පඩි ලබන කම්කරුවකු සම්බන්ධයෙන් වූ කල්හි, එම නිවාඩු දිනය යෙදුණු මාසයේ වැඩ කරන සාමාන්‍ය දවසකට ගෙවන අඩුම වැටුප් ප්‍රමාණයට අඩු නොවිය යුතුයි.

2. එසේ වුවද පහත දක්වෙන කොන්දේසිවලට යටත්ව (1) (අ) වැනි ඡේදයේ සඳහන් ඕනෑම ආණ්ඩුවේ නිවාඩු දවසක ඕනෑම ස්ථිර කම්කරුවකු සේවා යෝජකයකු විසින් සිය සේවයෙහි යොදවා ගත හැකිය :—

(අ) එම ආණ්ඩුවේ නිවාඩු දවසින් පසුවම එන දෙසැම්බර් මස තිස් එක්වන දින හෝ ඊට පෙර දිනයක් එම කම්කරුවාට නිවාඩු දිනයක් වශයෙන් දිය යුතු අතර එකී විකල්ප නිවාඩු දිනය දුන් මාසයේ වේතනය ගණන් බැලීම සඳහා ඒ දිනය වැඩ කරන සාමාන්‍ය දිනයක් වශයෙන් සැලකිය යුතුය ; නැතහොත්

(ආ) එම ස්ථිර කම්කරුවාට මාසයේ වේතනවලට අමතරව, වැඩ කරන සාමාන්‍ය දවසකට අඩංගු ඔහුට නියමිත සාමාන්‍ය කාල වේලාවන් නොයික්මවා කළ වැඩ වෙනුවෙන් අඩුම මාසික වේතන ප්‍රමාණයෙන් 1/25 පංගුවකට නො අඩු ප්‍රමාණයක් බැගින් ද අඩුම සාමාන්‍ය පැ ගණන ඉක්මවා කළ වැඩ වෙනුවෙන් පැයකට ගෙවන සාමාන්‍ය ප්‍රමාණය (අඩුම මාසික ප්‍රමාණය 200 න් බෙදා මෙය සොයා ගත යුතුය) මෙන් තුන් ගුණයකට නොඅඩු ප්‍රමාණයක් බැගින් ද වේතන ගෙවිය යුතුය.

3. පහත දක්වෙන කොන්දේසිවලට යටත්ව ඕනෑම දවස් පඩි ලබන කම්කරුවකු වුවද 1 වන ඡේදයේ සඳහන් ඕනෑම ආණ්ඩුවේ නිවාඩු දවසක සිය සේවයෙහි යොදවා ගැනීමට සේවායෝජකයකුට පුළුවන :—

(අ) එම ආණ්ඩුවේ නිවාඩු දවසින් පසුව එන දෙසැම්බර් මස තිස් එක්වන දින හෝ ඊට පෙර දිනයක් එම කම්කරුවාට එකී දිනය යෙදෙන මාසයේ වැඩ කරන සාමාන්‍ය දිනයකට ගෙවිය යුතු අඩුම දෛනික වේතන ප්‍රමාණයට නොඅඩු වේතනයක් හා සමග විකල්ප නිවාඩු දිනයක් වශයෙන් දිය යුතුය ; නැතහොත්

(ආ) එබඳු ආණ්ඩුවේ නිවාඩු දිනයක දී කරන ලද වැඩ වෙනුවෙන්, වැඩ කරන සාමාන්‍ය දවසකට අඩංගු ඔහුට නියමිත සාමාන්‍ය පැ ගණන තුළ කරන ලද වැඩ සඳහා අඩුම දෛනික වේතන ප්‍රමාණය මෙන් දෙගුණයකට නොඅඩු පඩියක් ද වැඩ කරන සාමාන්‍ය දවස ඉක්මවා කරන ලද වැඩ වෙනුවෙන් පැයකට ගෙවන සාමාන්‍ය ප්‍රමාණය (කම්කරුවාගේ අඩුම දෛනික වේතන ප්‍රමාණය වැඩ කරන සාමාන්‍ය දවසකට ඔහුට නියමිත අඩුම පැ ගණනින් බෙදීමෙන් මෙය සොයා ගත යුතුය) මෙන් තුන් ගුණයකට නො අඩු පඩියක් ද එම කම්කරුවාට ගෙවිය යුතුය. ''

12–1507

---

එල්.ඩී.බී.—80/44.

## පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

පඩිපාලක සභා ආඥපනතේ (136 පරිච්ඡේදය) 20(2)(ඩී) යන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් වර්ෂ 1944 නොවැම්බර් 3 දින අංක 9,327, වර්ෂ 1946 අගෝස්තු 16 දින අංක 9,591, වර්ෂ 1947 මාර්තු 21 දින අංක 9,683, වර්ෂ 1948 දෙසැම්බර් 10 දින අංක 9,928, වර්ෂ 1949 අප්‍රේල් 1 දින අංක 9,963 වර්ෂ 1950 ජූනි 2 දින අංක 10,108, වර්ෂ 1953 ජූනි 25 දින අංක 10,541, වර්ෂ 1958 ඔක්තෝබර් මස 27 දින අංක 11,568, වර්ෂ 1961 ජූලි 7 දින අංක 12,508, වර්ෂ 1962 ජූනි 22 දින අංක 13,179, වර්ෂ 1963 පෙබරවාරි මස 22 දින අංක 13,529, සහ වර්ෂ 1966 මාර්තු 18 දින අංක 14,687 යන ගැසට් පත්‍රයන්හි පළ කරන ලද නිවේදන මාර්ගයෙන් නියම බලධරයා ලෙස පත්කරනු ලැබූ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂ තැන්පත් ලෙස්ලි බර්ට්‍රම් රාජකරුණා වන මම, මෙහි දක්වෙන උප ලේඛනයෙහි සඳහන් එක් එක් ව්‍යාපාර යෙහි නියුක්ත සේවකයින් කෙරෙහි වර්ෂ 1969 දෙසැම්බර් මස තුළ අදල කළ හැකි ජීවන වියදම් දර්ශනාංකය 134.6 වන බව මෙයින් ප්‍රකාශ කරමි.

ලෙස්ලි බර්ට්‍රම් රාජකරුණා,
ජන ලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1969 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ 7, තැ. පෙ. 563 දරණ
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේදීය.

### උප ලේඛනය

1. මුද්‍රණ ව්‍යාපාරය.
2. මෝටර් රථ ගමනා ගමන ව්‍යාපාරය.
3. ගිනිපෙට්ටි සෑදීමේ ව්‍යාපාරය.
4. සිනමා (චිත්‍රපටි) ව්‍යාපාරය.
5. නෞකාගාර, නැව්තොට හා වරාය ගමනාගමන ව්‍යාපාරය.
6. ගොඩනැගිලි ව්‍යාපාරය.
7. තේ වැවීමේ සහ සෑදීමේ ව්‍යාපාරය.
8. කොකෝවා, කර්දමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ සෑදීමේ ව්‍යාපාරය.
9. රබර් වැවීමේ සහ සෑදීමේ ව්‍යාපාරය.
10. පොල් වැවීමේ ව්‍යාපාරය.
11. පොල් සෑදීමේ ව්‍යාපාරය.
12. මිනිරන් ව්‍යාපාරය.
13. බේකරි ව්‍යාපාරය.
14. ගඩොල් හා උළු සෑදීමේ ව්‍යාපාරය.
15. ගුදිරි කොහු හා ඇටකෙඳි කොහු පිටරට යැවීමේ ව්‍යාපාරය.
16. අයිස් සහ සිසිල් බීම සෑදීමේ ව්‍යාපාරය.
17. ඇඳුම් සෑදීමේ ව්‍යාපාරය.

12–1508/1

**තේ වැවීමේ හා සැදීම, රබර් වැවීම හා සැදීම, කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීම හා සැදීම, පොල් වැවීම, පොල් සැදීම, මිණිරන්, මුද්‍රණ, මෝටර් රථ ගමනාගමන, ගිනිපෙට්ටි සැදීම, චිත්‍රපට (සිනමා), නෞකාගාර නැව්තොට හා වරායන්හි ගමනාගමනය, ගොඩනැගිලි, බේකරි, ගඩොල් හා උළු සැදීම, ශුදිරි කොහු හා ඇටකෙඳි කොහු පිටරට යැවීම හා අයිස් හා සිසිල් බීම සැදීමේ සහ ඇඳුම් සැදීමේ යන කර්මාන්තවල නියුක්ත වැඩකරුවන්හට ගෙවිය යුතු විශේෂ දීමනා**

ඉහත සඳහන් කර්මාන්ත සඳහා 1969 දෙසැම්බර් මාසයේ ජීවන වියදම් 134.6 අංකය වන නිසා, ඒ ඒ අවස්ථාවේ හැටියට, 1970 ජනවාරි මාසය වෙනුවෙන් හෝ 1970 ජනවාරි මාසයේ සාමාන්‍ය වැඩ කරන දිනයන් වෙනුවෙන් හෝ ගෙවිය යුතු විශේෂ දීමනාව පහත දක්වෙන ආකාරයට බැව්, (136 වැනි පරිච්ඡේදය වන) පඩිපාලක සභා ආඥපනතේ, 20 (2) (ඇ) යන වගන්තිය යටතේ, මෙයින් නිවේදනය කරනු ලැබේ:—

**1. තේ වැවීම හා සැදීම, රබර් වැවීම හා සැදීම, කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීම හා සැදීම යන කර්මාන්ත :**

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| වයස අවුරුදී 16 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට ... ... ... | 1 66 |
| වයස අවුරුදු 15 කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... ... | 1 20 |
| ළමා වැඩකරුවකුට ... ... ... ... ... | 1 13 |

**2. පොල් වැවීමේ කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩකරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු.ශ. |
|---|---|
| වයස අවුරුදු 16 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට (කංකානමද ඇතුළුව) ... ... | 1 66 |
| වයස අවුරුදු 15 කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... | 1 20 |
| වයස අවුරුදු 16 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට හෝ වයස අවුරුදු 15 කට අඩු ගැහැණු වැඩකාරියකට ... ... ... ... ... | 1 13 |

**3. පොල් සැදීමේ කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| වයස අවුරුදු 18 ට අඩු නැති පිරිමි වැඩකරුවකුට (කංකානමද ඇතුළුව) ... ... | 2 51 |
| වයස අවුරුදු 18 කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... | 2 0 |
| වයස අවුරුදු 18 කට අඩු (ස්ත්‍රී පුරුෂ භෙදය නොසළකා) වැඩකරුවකුට ... ... | 1 93 |

**4. මිණිරන් කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩකරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| විකිණිය හැකි මිනිරන් ශුද්ධ කිරීම හා සකස් කිරීම පිළිබඳ වැඩවල යෙදී සිටින අය නොවන වැඩ කරුවන් :— | |
| වයස අවුරුදු 18 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට ... ... ... | 1 72 |
| වයස අවුරුදු 18 කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... ... | 1 24 |
| වයස අවුරුදු 18 කට අඩු (ස්ත්‍රී පුරුෂ භෙදයක් නොසලකා) වැඩකරුවකුට ... | 1 17 |
| විකිණිය හැකි මිණිරන් ශුද්ධ කිරීම සහ සකස් කිරීම පිළිබඳ වැඩවලයෙදී සිටින වැඩකරුවෝ : | |
| වයස අවුරුදු 18 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට ... ... ... | 1 92 |
| වයස අවුරුදු 18 කට අඩු නැති ගැහැණු වැඩකාරියකුට ... ... ... | 1 44 |
| වයස අවුරුදු 18 කට අඩු (ස්ත්‍රී පුරුෂ භෙදයක් නොසළකා) වැඩකරුවකුට ... ... | 1 37 |

**5. මුද්‍රණ කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | මාසයට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| වැඩ ඉගෙන ගන්නන් හා වැඩ පුරුදු වන්නන් නොවන වැඩ කරුවෝ — | |
| "ඒ" පන්තිය ... ... ... | 134 42 |
| "බී" පන්තිය ... ... ... | 106 42 |
| "සී" පන්තිය I වන වර්ගය ... ... ... | 92 42 |
| "සී" පන්තිය II වන වර්ගය ... ... ... | 85 24 |
| "ඩී" පන්තිය ... ... ... | 78 42 |
| "ඊ" පන්තිය ... ... ... | 75 01 |
| "එෆ්" පන්තිය ... ... ... | 47 62 |
| "ජී" පන්තිය ... ... ... | 78 42 |

වැඩ ඉගෙන ගන්නෝ හා වැඩ පුරුදු වන්නෝ—

| | 1 වැනි අවුරුද්ද රු. ශ. | 2 වැනි අවුරුද්ද රු. ශ. | 3 වැනි අවුරුද්ද රු. ශ. | 4 වැනි අවුරුද්ද රු. ශ. | 5 වැනි අවුරුද්ද රු. ශ. |
|---|---|---|---|---|---|
| "ඒ" පන්තිය ... ... | 53 52 | 65 22 | 76 92 | 94 22 | 112 02 |
| "බී" පන්තිය ... ... | 45 12 | 62 42 | 71 32 | 84 24 | |
| "සී" පන්තිය I වන වර්ගය ... | 47 92 | 55 24 | 62 92 | 74 01 | |
| "සී" පන්තිය II වන වර්ගය ... | 45 12 | 51 83 | 58 54 | 68 53 | |
| "ඩී" පන්තිය ... ... | 42 32 | 48 42 | 54 52 | 63 42 | |

**6. මෝටර් රථ ගමනාගමන කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | විශේෂ දීමනාව | |
|---|---|---|
| | මාසයට රු.. ශ. | සාමාන්‍ය වැඩකරන දිනයකට රු. ශ. |
| "ඒ", "බී", "ඩී" හා "එෆ්" යන පන්ති ... ... | 78 42 | 3 42 |
| "සී" පන්තිය ... ... ... ... | 75 92 | 3 42 |
| "ඊ" පන්තිය ... ... ... ... | 73 42 | 3 17 |
| "පී" හා "එච්" පන්ති ... ... ... | 72 82 | 3 42 |
| "කේ" පන්තිය ... ... ... ... | 60 67 | 2 30 |
| "අයි" හා "ජේ" පන්ති ... ... ... | 72 82 | — |

**7. ගිනිපෙට්ටි සෑදීමේ කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව — පුරුෂයින්ට රු. ශ. | ස්ත්‍රීන්ට රු. ශ. |
|---|---|---|
| ඒ. වැඩිහිටි අය (වයස අවුරුදු 18 සහ ඊට වැඩි)— | | |
| I වන හා II වන වර්ග | 2 30 | 2 20 |
| III වන වර්ගය | 2 20 | 2 08 |
| IV වන වර්ගය | 2 30 | — |
| බී. තරුණ අය— | | |

| වැඩකරුවාගේ පන්තිය | ස්ත්‍රී පුරුෂ භෙදයක් නොසළකා රු. ශ. |
|---|---|
| I වන හා II වන වර්ග—වයස අවුරුදු 14 ට වැඩිවූ සහ අවුරුදු 18 ට අඩුවූ විට | 1 72 |
| III වන වර්ගය—වයස අවුරුදු 16 සහ ඊට වැඩි එහෙත් අවුරුදු 18 ට අඩු වූ විට | 1 72 |
| වයස අවුරුදු 14 ට වැඩි එහෙත් අවුරුදු 16ට අඩුවූ විට | 1 34 |

**8. චිත්‍රපට (සිනමා) කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | මාසයට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| ඒ. ලිපිකාර නොවූ— | |
| අදක්ෂ/නුපුහුණු වැඩකරුවෝ | 66 70 |
| අර්ධ වශයෙන් පුහුණු වැඩකරුවෝ | 69 30 |
| පුහුණු වැඩකරුවෝ, I වන සහ II වන වර්ග | 71 12 |
| බී. ලිපිකාර— | |
| III වන වර්ගය | 61 50 |
| II වන වර්ගය | 64 50 |
| I වන වර්ගය | 69 50 |

**9. නෞකාගාර, නැව්තොට හා වරායයන්හි ගමනා ගමන කර්මාන්තය :**

| වැඩ කරුවාගේ පන්තිය | මාසයට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| බර වැඩ— | |
| විශේෂ වර්ගය | 46 75 |
| පුහුණු වර්ගය | 42 75 |
| අර්ධ වශයෙන් පුහුණු වර්ගය, අදක්ෂ/නුපුහුණු I වන හා II වන වර්ග සහ ගැහැණු වැඩකාරියෝ | 39 75 |
| බර වැඩ නොවන වැඩ— | |
| විශේෂ වර්ගය | 57 0 |
| I වන වර්ගය | 42 75 |

**10. ගොඩනැගිලි කර්මාන්තය :**

| වැඩ කරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| අදක්ෂ/නුපුහුණු කම්කරුවෝ | 2 57 |
| අර්ධ වශයෙන් පුහුණු II වන වර්ගය, අර්ධ වශයෙන් පුහුණු I වන වර්ගය හා පුහුණු වැඩකරුවෝ | 2 67 |

**11. බේකරි කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | මාසයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| "ඒ" පන්තියේ වැඩකරුවෙකුට | 82 55 |
| "බී" පන්තියේ වැඩකරුවෙකුට | 75 0 |
| "සී" පන්තියේ වැඩකරුවෙකුට | 55 30 |

**12. ගඩොල් හා උළු සෑදීමේ කර්මාන්තය :**

| කම්කරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩකරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| "ඒ" වයස අවුරුදු 18 ට නොඅඩු පිරිමි කම්කරුවෝ— | |
| පුහුණු කම්කරුවෝ I හා II වන වර්ග හා අර්ධ වශයෙන් පුහුණු වූ කම්කරුවෝ | 2 45 |
| නුපුහුණු කම්කරුවෝ (අදක්ෂ) | 2 35 |
| "බී" වයස අවුරුදු 18 ට නො අඩු ගැහැණු කම්කරුවෝ | 2 24 |
| "සී" වයස අවුරුදු 18 ට අඩු කම්කරුවෝ (ස්ත්‍රී පුරුෂ භෙදයක් නොසලකා)— | |
| වයස අවුරුදු 14 ට වැඩි එහෙත් 15 ට අඩු | 1 72 |
| වයස අවුරුදු 15 ට වැඩි එහෙත් 16 ට අඩු | 1 77 |
| වයස අවුරුදු 16 ට වැඩි එහෙත් 17 ට අඩු | 1 82 |
| වයස අවුරුදු 17 ට වැඩි එහෙත් 18 ට අඩු | 1 92 |

**13. ගුදිරි කොහු හා ඇටකෙදි කොහු පිටරට යැවීමේ කර්මාන්තය :**

| කම්කරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩකරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| "ඩී" වයස අවුරුදු 18 ට අඩු (ස්ත්‍රී/පුරුෂ භෙදයක් නොමැතිව) කම්කරුවෝ— | |
| වයස අවුරුදු 14 ට වැඩි එහෙත් 15 ට අඩු | 1 89 |
| වයස අවුරුදු 15 ට වැඩි එහෙත් 16 ට අඩු | 1 94 |
| වයස අවුරුදු 16 ට වැඩි එහෙත් 17 ට අඩු | 1 99 |
| වයස අවුරුදු 17 ට වැඩි එහෙත් 18 ට අඩු | 2 09 |

**14. අයිස් හා සිසිල් බීම සෑදීමේ කර්මාන්තය :**

| කම්කරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩකරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව<br>රු. ශ. |
|---|---|
| I වැනි හා II වැනි ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... | 2 67 |
| III වැනි ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... ... | 2 57 |

**15. ඇඳුම් සෑදීමේ කර්මාන්තය :**

| කම්කරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩකර දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව<br>රු. ශ. |
|---|---|
| I (අ) ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... ... | 3 42 |
| I (ආ) ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... ... | 3 42 |
| II වන ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... ... | 2 67 |
| III වන ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... ... | 2 57 |
| IV වන ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... ... | 2 35 |
| V වන ශ්‍රෙණියේ කම්කරුවෝ (ආධුනිකයන් පුහුණුවන්නන්) ... ... | 2 01 |

ආර්. එල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්.

වර්ෂ 1969 දෙසැම්බර් මස 29 දින,
කොළඹ දීය.

12–1508/2

---

**අඩුම වැටුප් (ඉන්දියානු කම්කරු) ආඥපනතේ විධිවිධාන (133 වන පරිච්ඡේදය) යටතේ සැලකෙන්නාවූත් කම්කරු පඩි සහා තීරණ අදාල නොවන්නාවූත් කම්කරුවනට ගෙවිය යුතු ජීවනාධාර මුදල**

අඩුම වැටුප් (ඉන්දියානු කම්කරු) ආඥ පනතේ විධිවිධාන යටතේ සැලකෙන්නාවූත්, කම්කරු පඩි සහා ආඥ පනත යටතේ නියමිත අඩුම වැටුප් ගෙවිය යුතු නොවන්නාවූත් කම්කරුවකුට 1969 දෙසැම්බර් මාසයේ වැඩ කරන එක් එක් දවසකට ගෙවිය යුතු ජීවනාධාර මුදල සියලු දොනාගේම දන ගැනීම් පිණිස මෙහි පහත පළ කරනු ලැබේ.

| | උඩරට<br>රු. ශ. | මැදිරට<br>රු. ශ. | පහතරට<br>රු. ශ. |
|---|---|---|---|
| පිරිමි කම්කරුවකුට ... ... | 1 16 ... | 1 12 ... | 1 07 |
| කම්කරු ස්ත්‍රියකට ... ... | 92 ... | 89 ... | 86 |
| ළමා කම්කරුවකුට ... ... | 92 ... | .89 ... | 86 |

වත්තක් උඩරට; මැදිරට හෝ පහත රට යනුවෙන් සැලකෙන්නේ වර්ෂ 1940 දෙසැම්බර් මස 23 වන දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1940 දෙසැම්බර් මස 21 වන දින අංක 281 දරන නිවේදනයේ පෙන්නා ඇති පරිද්දෙනි.

ආර්. එල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්.

වර්ෂ 1969 දෙසැම්බර් මස 29 දින,
කොළඹදීය.

12–1508/3

---

සැ. යු.—14,884/1 කාණ්ඩයේ අවසාන අති විශෙෂ ගැසට් අංකය 14,884/4.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි